මගේ අංකය: 5/2/4/03/2020
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2020.07.      වන දින

අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

## බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2020)

උක්ත විභාගය සඳහා අයදුම් කිරීමේ ආකෘති පත්‍ර මේ සමග එවා ඇත. පිටපත් 02 කින් යුතු මෙම ආකෘති පත්‍රවල සම්පූර්ණ කළයුතු සියලුම තොරතුරු ඒකාකාර ලෙස ඇතුළත් කර පළමු වන පිටපත (සුදුපාට) මා වෙත ඉදිරිපත් කරන්න. දෙවන පිටපත (නිල්පාට) ඔබ ආයතනයේ ගොනුකර තබන්න. සියලුම අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් කිරීමට ලබාදී ඇති අයදුම්පත ප්‍රමාණවත් නොවන්නේ නම් අතිරේක අයදුම්පත්, දහම් පාසලේ නම, ලිපිනය හා දහම් පාසල් අංකය මතු දක්වා ඇති දුරකථන අංකවලට දැනුම් දීමෙන් තැපැල් මගින් ගෙන්වා ගත හැක. අයදුම්පත දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කිරීමට ද පහසුකම් සලසා ඇත. (www.doenets.lk)

02. ඔබ දහම් පාසලට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇත ඉලක්කම් හයකින් යුත් දහම් පාසල් අංකය, ඔබ වෙත අයදුම්පත් එවා ඇති කවරයේ SCH NO යනුවෙන් සඳහන් කර ඇත. එය නිවැරදිව අයදුම්පතේ සඳහන් කරන්න. නව දහම් පාසලක් නම් "**<u>නව දහම් පාසලකි</u>**" යන්න, අංකය සඳහන් කළ යුතු කොටු පෙළට ඉහළින් ලියන්න.

03. අයදුම්පතේ පසුපිටේ සඳහන් උපදෙස් කියවීමෙන් අනතුරුව අයදුම්පත පිරවීමට කටයුතු කරන්න.

04. මෙම විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා නියමිත විෂයයන් 05 ම සමත් විය යුතුය. කෙසේ වෙතත් විෂයයන් 04 ක් සමත් වී එක විෂයයක් අසමත් වූයේ නම් ඌන සාමර්ථ්‍යයක් ලැබෙනු ඇත. ඌන සාමර්ථ්‍යය ලබාගත් වර්ෂයේ සිට අනුගාමී විභාග අවස්ථා 03 ක ඇතුළත ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සමත්වීමෙන් සම්පූර්ණ සාමර්ථ්‍යය ලබාගත හැක. **එක් විෂයකට වඩා අසමත් වී ඇත්නම් සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටිය යුතුවේ.**

05. යම්කිසි අපේක්ෂකයකු ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කර ඇත්නම් ඒ බව විභාගයේ ප්‍රතිඵල නිකුත් කර තෙමසක් ඉකුත්වීමට පෙර නියෝජ්‍ය විභාග කොමසාරිස් (ප්‍රතිඵල - ආයතනික විභාග) වෙත ලියා දැන්විය යුතුය.

06. මෙම විභාගයට පෙනී සිටින, ආයතනයේ අධ්‍යාපනය නොලබන බාහිර අයදුම්කරුවන්ගෙන් පළමුවරට විභාගයට පෙනී සිටීමේදී රු. 200/- ක විභාග ගාස්තුවක් අයකරගත යුතුය. එහෙත් ආයතනයේ අධ්‍යාපනය ලබන අයදුම්කරුවන් පළමුවන අවස්ථාවේදී පමණක් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට අයදුම්කරන විෂයය සඳහා රුපියල් 50/- ක් ද දෙවන වර හෝ ඉන් පසු වාරයක් සඳහා විභාගයට පෙනී සිටින විට රු. 200/- ක් ද වශයෙන් විභාග ගාස්තු ගෙවිය යුතුය.

07. බෞද්ධ ධර්මාචාර්ය විභාගය සඳහා පෞද්ගලිකව (බාහිරව) අයදුම් කළ නොහැකි අතර එවැනි අයදුම්කරුවන් දහම් පාසලක් / පිරිවෙනක් හෝ එබඳු ආයතනයක් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එවැනි අයදුම්කරුවන් ඔබ ආයතනය මගින් ඉදිරිපත් කිරීමේදී ඔවුන් මෙම විභාගයට පෙනී සිටීමට නියමිත සුදුසුකම් සපුරා ඇති බවට ලිපියක් ලබාගෙන දහම් පාසලේ / පිරිවෙනේ රඳවා ගත යුතුය. තවද ඔවුන්ගෙන් අදාළ විභාග ගාස්තු ලබාගෙන එම මුළු මුදල ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතට අලවා එවිය යුතුය.

08. ඇමුණුමේ දැක්වෙන නගරවල පමණක් විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන බැවින්, එම නගරවලට අමතරව වෙනත් නගරවල නම් සඳහන් නොකළ යුතුය. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් ඔවුන්ගේ දෙවන කැමැත්ත අනුව හෝ අයදුම්කොට ඇති මධ්‍යස්ථානයට සමීප මධ්‍යස්ථානයක් වෙත හෝ එම අයදුම්කරුවන් යොමු කරනු ඇත. **<u>ප්‍රවේශ පත්‍ර නිකුත් කළ පසු කිසිදු හේතුවක් මත විභාග මධ්‍යස්ථානය වෙනස් කරනු නොලැබේ.</u>**

09. අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේදීම තමා අයදුම් කරන විෂයයන් පිළිබඳව මනා අවබෝධයකින් යුතුව සඳහන් කළ යුතු අතර කවර හේතුවක් නිසාවත් විභාගය පැවැත්වෙන අවස්ථාවේදී අයදුම් කර ඇති විෂයයන් වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය, අදාළ කොටුව තුළ නිවැරදිව අනිවාර්යයෙන් සටහන් කරන්න. අයදුම්කරු ඉදිරිපිටදී අදාළ විස්තර අයදුම්පතට ඇතුළත් කර අයදුම්කරුට එය පරීක්ෂා කිරීමට අවස්ථාව ලබාදී අත්සන ලබාගැනීමට කටයුතු කරන්න.

11. අයදුම්පත් බහා එවීම සඳහා විභාග දෙපාර්තමේන්තුවේ ලිපිනය සඳහන් කවරයක් මේ සමග එවා ඇත. එහි වම්පස ඉහළ කෙළවරේ විභාගයට අයදුම් කරන නගරය හා නගර අංකය ද දහම් පාසලට හිමි පරිගණක අංකය අදාළ කොටුව තුළද පැහැදළිව සටහන් කර එවිය යුතුය. (ඇමුණුමේ සඳහන නගර ලේඛනය අනුව) සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය එම කවරයේ බහා ලියාපදිංචි තැපැලෙන් 2020.08.21 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ, **විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට තැපැල් කළ යුතුය.

**වැදගත්**

01. අයදුම්පත් පිරවීමට පෙර එහි ඇති උපදෙස් හොඳින් කියවා පැහැදිලිව අවබෝධ කරගන්න.
02. නම් ඇතුළත් කර ඇති සියලුම අයදුම්කරුවන්ගේ අත්සන ලබා ගැනීමට කරුණාකර සැලකිලිමත් වන්න.
03. මුදල් ගෙවූ කුවිතාන්සියේ තොරතුරු ප්‍රදර්ශනය වන පරිදි එය අයදුම්පතේ පසුපිටුවෙහි ඉහළ දකුණු කෙළවරේ අලවන්න.
04. නියමිත විභාග ගාස්තු නොගෙවූ සහ අත්සන් කර නොමැති අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.
05. ඔබව සම්බන්ධ කර ගත හැකි ජංගම දුරකථන අංකයක් අයදුම්පතේ අදාළ ස්ථානයේ සඳහන් කරන්න.
06. ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය අදාළ කොටුව තුළ නිවැරදිව සටහන් කරන්න.
07. අයදුම්කරුවන්ගේ දුරකථන අංක ඔවුන්ගේ නම් ඉදිරියෙන් සටහන් කරන්න.

කවර හේතුවක් නිසාවත් අවසාන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන බව විශේෂයෙන් සැලකිය යුතුය.

ඩබ්ලිව්.එම්.ජ.කේ. විජේකෝන්,
නියෝජ්‍ය විභාග කොමසාරිස් (සංවිධාන),
විභාග කොමසාරිස් ජනරාල් වෙනුවට

ඇමුණුම

# බෞද්ධ ධර්මාචාර්ය විභාගය
## විභාග මධ්‍යස්ථාන පිහිටවනු ලබන නගර ලේඛනය

| දිස්ත්‍රික්කය - කොළඹ 01 | |
|---|---|
| නගරය | නගර අංකය |
| කොටහේන | 101 |
| මරදාන | 102 |
| බොරැල්ල | 103 |
| බම්බලපිටිය | 104 |
| මහරගම | 105 |
| ගල්කිස්ස | 106 |
| දෙහිවල | 107 |
| නුගේගොඩ | 108 |
| මොරටුව | 109 |
| පිළියන්දල | 110 |
| හෝමාගම | 111 |
| අවිස්සාවේල්ල | 112 |

| දිස්ත්‍රික්කය - ගම්පහ 02 | |
|---|---|
| නගරය | නගර අංකය |
| ගම්පහ | 201 |
| වේයන්ගොඩ | 202 |
| මිනුවන්ගොඩ | 203 |
| මීරිගම | 204 |
| මීගමුව | 205 |
| වත්තල | 206 |
| කැලණිය | 207 |

| දිස්ත්‍රික්කය - කළුතර 03 | |
|---|---|
| නගරය | නගර අංකය |
| කළුතර | 301 |
| පානදුර | 302 |
| අළුත්ගම | 303 |
| හොරණ | 304 |
| මතුගම | 305 |
| මීගහතැන්න | 306 |

| දිස්ත්‍රික්කය - මාතලේ 04 | |
|---|---|
| නගරය | නගර අංකය |
| මාතලේ | 401 |
| ගලේවෙල | 402 |
| දඹුල්ල | 403 |
| නාඋල | 404 |
| ලග්ගල | 405 |
| විල්ගමුව | 406 |

| දිස්ත්‍රික්කය - මහනුවර 05 | |
|---|---|
| නගරය | නගර අංකය |
| මහනුවර | 501 |
| කටුගස්තොට | 502 |
| නුගවෙල | 503 |
| ඉහල්දෙනිය | 504 |
| මැද මහනුවර | 505 |
| වත්තේගම | 506 |
| ගලහ | 507 |
| ගලගෙදර | 508 |
| ගම්පොළ | 509 |
| නාවලපිටිය | 510 |
| පිළිමතලාව | 511 |

| දිස්ත්‍රික්කය - නුවරඑළිය 06 | |
|---|---|
| නගරය | නගර අංකය |
| නුවරඑළිය | 601 |
| හැදුනුවැට | 602 |
| හැටන් | 603 |
| ගිනිගත්හේන | 604 |
| හඟුරන්කෙත | 605 |
| වලපනේ | 606 |

| දිස්ත්‍රික්කය - ගාල්ල 07 | |
|---|---|
| නගරය | නගර අංකය |
| ගාල්ල | 701 |
| අම්බලන්ගොඩ | 702 |
| බලපිටිය | 703 |
| ඇල්පිටිය | 704 |
| බද්දේගම | 705 |
| උඩුගම | 706 |
| අහංගම | 707 |

| දිස්ත්‍රික්කය - මාතර 08 | |
|---|---|
| නගරය | නගර අංකය |
| මාතර | 801 |
| වැලිගම | 802 |
| කඹුරුපිටිය | 803 |
| හක්මන | 804 |
| දික්වැල්ල | 805 |
| අකුරැස්ස | 806 |
| දෙනියාය | 807 |
| කොටපොල | 808 |

| දිස්ත්‍රික්කය - හම්බන්තොට 09 | |
|---|---|
| නගරය | නගර අංකය |
| හම්බන්තොට | 901 |
| වලස්මුල්ල | 902 |
| වීරකැටිය | 903 |
| තංගල්ල | 904 |
| අම්බලන්තොට | 905 |
| බෙලිඅත්ත | 906 |
| තිස්සමහාරාමය | 907 |
| අඟුණකොළපැලැස්ස | 908 |

| දිස්ත්‍රික්කය - වව්නියාව 10 | |
|---|---|
| නගරය | නගර අංකය |
| වව්නියාව | 1001 |

| දිස්ත්‍රික්කය - ත්‍රිකුණාමලය 11 | |
|---|---|
| නගරය | නගර අංකය |
| ත්‍රිකුණාමලය | 1101 |
| කන්තලේ | 1102 |

| දිස්ත්‍රික්කය - අම්පාර 12 | |
|---|---|
| නගරය | නගර අංකය |
| අම්පාර | 1201 |
| සේරංකඩ | 1202 |
| මහඔය | 1203 |
| දෙහිඅත්තකණ්ඩිය | 1204 |

| දිස්ත්‍රික්කය - පුත්තලම 13 | |
|---|---|
| නගරය | නගර අංකය |
| පුත්තලම | 1301 |
| ආණමඩුව | 1302 |
| හලාවත | 1303 |
| වෙන්නප්පුව | 1304 |

| දිස්ත්‍රික්කය - කුරුණෑගල 14 | |
|---|---|
| නගරය | නගර අංකය |
| කුරුණෑගල | 1401 |
| පොල්ගහවෙල | 1402 |
| ඉබ්බාගමුව | 1403 |
| මැල්සිරිපුර | 1404 |
| කුලියාපිටිය | 1405 |
| හෙට්ටිපොල | 1406 |
| නියවැරටිය | 1407 |
| මහව | 1408 |
| ගල්ගමුව | 1409 |

| දිස්ත්‍රික්කය - අනුරාධපුර 15 | |
|---|---|
| නගරය | නගර අංකය |
| අනුරාධපුරය | 1501 |
| මැදවච්චිය | 1502 |
| කැකිරාව | 1503 |
| පදවිය | 1504 |
| ගලෙන්බිඳුනුවැව | 1505 |
| තඹුත්තේගම | 1506 |
| හොරොව්පතාන | 1507 |
| කෝට්ටියාගම | 1508 |

| දිස්ත්‍රික්කය - පොළොන්නරුව 16 | |
|---|---|
| නගරය | නගර අංකය |
| පොළොන්නරුව | 1601 |
| මනම්පිටිය | 1602 |
| හිඟුරක්ගොඩ | 1603 |
| මැදිරිගිරිය | 1604 |

| දිස්ත්‍රික්කය - බදුල්ල 17 | |
|---|---|
| නගරය | නගර අංකය |
| බදුල්ල | 1701 |
| වැලිමඩ | 1702 |
| බණ්ඩාරවෙල | 1703 |
| පස්සර | 1704 |
| මහියංගනය | 1705 |
| හිරාදුරුකෝට්ටේ | 1706 |
| මීගහකිවුල | 1707 |

| දිස්ත්‍රික්කය - මොණරාගල 18 | |
|---|---|
| නගරය | නගර අංකය |
| මොණරාගල | 1801 |
| බිබිල | 1802 |
| වැල්ලවාය | 1803 |
| කතරගම | 1804 |
| දොඹගහවෙල | 1805 |

| දිස්ත්‍රික්කය - කෑගල්ල 19 | |
|---|---|
| නගරය | නගර අංකය |
| කෑගල්ල | 1901 |
| අරණායක | 1902 |
| රඹුක්කන | 1903 |
| මාවනැල්ල | 1904 |
| රුවන්වැල්ල | 1905 |
| යටියන්තොට | 1906 |
| වරකාපොළ | 1907 |

| දිස්ත්‍රික්කය - රත්නපුර 20 | |
|---|---|
| නගරය | නගර අංකය |
| රත්නපුර | 2001 |
| ඇහැළියගොඩ | 2002 |
| පැල්මඩුල්ල | 2003 |
| බලංගොඩ | 2004 |
| ඇඹිලිපිටිය | 2005 |
| රක්වාන | 2006 |
| කලවාන | 2007 |